කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சு

Ministry of Women and Child Affairs

| | | |
|---|---|---|
| මගේ අංකය. எனது.இல. My No | } | MWCA/2/5/3/12/අභ්‍යන්තර ස්ථාන මාරු |
| ඔබේ අංකය. உமது.இல Your No. | } | |
| දිනය. திகதி Date | } | 2025.01.28 |


දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම්

<u>වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාර නිලධාරීන්ගේ වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් කැඳවීම **2025**</u>

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට අනුයුක්තව දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ උපදේශන මධ්‍යස්ථානවල සේවයේ නියුතු වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාර නිලධාරීන්ගෙන් 2025 වර්ෂය සඳහා අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02.සියලුම අයදුම්පත් මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රය (01 ඇමුණුම) අනුව ඉදිරිපත් කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදී ඔබගේ නිර්දේශ සමග **2025 පෙබරවාරි 14** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත එවීමට සැලැස්විය යුතුය.

<u>ස්ථාන මාරු සඳහා නිලධරයන්ගේ සුදුසුකම් තීරණය කිරීමේ පොදු ප්‍රතිපත්ති:</u>

I. තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02ක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

II. <u>තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02කට අඩු සේවා කාලයක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.</u>

III. <u>තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 05ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සියලුම නිලධරයන් ස්ථාන මාරුවීම් අයදුම් කළ යුතුය.</u>

IV. <u>තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 05ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සියලුම නිලධරයන් ස්ථාන මාරුවීම් ඉල්ලීම් නොකළ ද මෙම ස්ථාන මාරුවීම් වලට යටත් වේ.</u>

V. තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 05ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද උපදේශන මධ්‍යස්ථාන හා රැකවරණ මධ්‍යස්ථාන නිලධරයන් ද ස්ථාන මාරුවීම් අයදුම් කළ යුතුය.

VI. තවද 2024.12.31 දිනට හෝ ඊට පෙර සේවා ස්ථනයන්හි සේවා කාලය වසර 05 සම්පූර්ණ කරන සියලු නිලධරයන් 2025 වාර්ෂික ස්ථන මාරු සඳහා ඉල්ලුම් කළ යුතු අතර ඔවුන්ගේ සාමාන්‍ය හෝ සුහද ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳවද සලකා නොබලන බව ද දන්වා සිටිමි.


| | | | | |
|---|---|---|---|---|
| ලේකම් செயலாளர் Secretary } 011-2186057 | කාර්යාලය அலுவலகம் office } 011-2186055 | ෆැක්ස් பெக்ஸ் Fax } 011-2187249 | ඊමේල් மின்தபால் Email } secretary@childwomenmin.gov.lk | |

05 වන මහල, II අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
05 ஆம் மாடி, கட்டம் II, செத்சிறிபாய, பத்தரமுல்லை.
05th Floor, Stage II, Sethsiripaya, Battaramulla

VII. ස්ථාන මාරුවීමට අපේක්ෂාවෙන් සිටින සහ මින් පෙර කිසිදු ස්ථාන මාරුවීමක් ලබා නොමැති නිලධාරීන් සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දෙනු ලැබේ.

VIII. නිලධාරීන් ඉල්ලුම් කර ඇති සේවා ස්ථානයන් ප්‍රමුඛතා පරිදි ලබා දීමට සළකා බලනු ලබන නමුත්, ඉල්ලුම් කර නොමැති සේවා ස්ථානයකට වුව ද ස්ථාන මාරු ලබා දිය හැකිය.

IX. නිලධාරීන්ගේ 2025 වාර්ෂික ස්ථාන මාරු නිවේදනය ප්‍රසිද්ධ කිරීමෙන් පසු එනම 2025.01.24 සිට 2025.06.02 දක්වා වූ කාල සීමාව තුලදී සාමාන්‍ය හා සුහද ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව සලකා නොබලන බව කාරුණිකව දන්වා සිටිමි.

X. එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට එක් නිලධාරියෙකු පමණක් අනුයුක්ත කරන අතර 2023 වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාර නිලධාරී ස්ථාන මාරු වීම් වලදී තාවකාලිකව අනුයුක්ත කල නිලධාරීන් සහ එක් කාර්යාලයක දෙදෙනා බැගින් සිටින සියළු නිලධාරීන් වෙනත් සේවා ස්ථානයකට අනුයුක්ත විය යුතුය.

XI. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණ අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලැබෙන අභියාචනා සළකා බලනු නොලැබේ.

04. අදාළ නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී එහි සඳහන් තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කර ඔබගේ නිර්දේශය සමඟ ඉදිරිපත් කරන්නේ නම් මැනවි.

05.ස්ථාන මාරුවීම් අයදුම්පත් ඉදිරිපත් කිරීමට මෙම අමාත්‍යාංශය මඟින් ඔබ දිස්ත්‍රික් /ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අනුයුක්ත කර ඇති දෙපාර්තමේන්තු ගත වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාර නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි.මෙම තොරතුරු අමාත්‍යාංශ වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත. (http://www.childwomenmin.gov.lk)

කේ.ඩී.ආර්.ඕල්ගා
ලේකම්